**සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක 28/2026**

මගේ අංකය:- PPSC/ES/10/FI/04/03-6
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා සංකීර්ණය,
නව නගරය, රත්නපුර.
2026.07.24.

01. ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව.
02. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, සබරගමුව පළාත.
03. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, රත්නපුර / කෑගල්ල.

**<u>සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අතුරු වෛද්‍ය සේවයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී විශේෂ ශ්‍රේණියට (MT – 8) උසස් කිරීම සඳහා තෝරා ගැනීම.</u>**

සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අතුරු වෛද්‍ය සේවයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී විශේෂ ශ්‍රේණියට (**MT – 8**) උසස් කිරීම, සබරගමුව පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක CS06/01/20/06 හා 2025.07.07, 2025.10.04 දිනැති ලිපි මඟින්, ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක CM/AD/13/01/06 හා 2025.06.30 සහ 2025.09.25 දිනැති ලිපි මඟින් සහ අංක CM/AD/13/01/01/වි.ශ්‍රේණිය හා 2026.06.02 දිනැති ලිපිය මඟින් නිර්දේශ කර ඇත. ඒ අනුව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ අංක PD/ADF/02/06/25 හා 2025.09.02 දිනැති, PD/ADF/02/06/26 හා 2026.05.18 දිනැති ලිපි මඟින් දක්වා ඇති පරිදි **2021.01.05, 2021.10.19** සහ **2022.12.31** යන දිනවලදී ඇති වී තිබෙන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරෙහි විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු තුන **(03)** සඳහා පහත සඳහන් සුදුසුකම් හා කොන්දේසි සපුරා ඇති නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. <u>වැටුප් පරිමාණය :-</u> පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරේ විශේෂ ශ්‍රේණියට හිමි වැටුප් ඛණ්ඩය වන MT 08-2016ට අදාළ වැටුප් පරිමාණය රු.50,200-1345×10-1630×8-76,690/- වේ.

02. අයදුම්කරුවන් විසින් තනතුරට අදාළ බඳවා ගැනීම් පරිපාටියට අනුව පහත සඳහන් සුදුසුකම් සියල්ල සපුරා තිබිය යුතු ය.

I. <u>පළපුරුද්ද :-</u> රාජ්‍ය සේවයේ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී තනතුරෙහි I ශ්‍රේණියේ / අධි ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

II. <u>කායික සුදුසුකම් :-</u> සෑම අපේක්ෂිකාවක්ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

III. <u>වෙනත් සුදුසුකම් :-</u>

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
- අයදුම්කාරියන් විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
- උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.
- අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබිය යුතු ය.
- පළමු වන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබිය යුතු ය.
- අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට සඳහන් කරනු ලබන දිනට සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය. එමෙන්ම අයදුම්කාරියන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ය.

**03.** <u>ලකුණු ලබාදීමේ ක්‍රමය :-</u> සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2020.10.06 දිනැතිව අනුමත කරන ලද පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී බඳවා ගැනීමේ පරිපාටියේ 10.4.4.7.2 අනුව ලකුණු ලබාදීමේ පරිපාටිය පහත පරිදි වේ.

| ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍රය | ලබා දෙනු ලබන ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා සළකා බලනු ලබන ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01.සේවා පළපුරුද්ද | 60 | අදාළ නොවේ |
| 02. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 | |
| 03. විශේෂ කුසලතාවයන් | 10 | |
| එකතුව | 100 | |

ඉහත සඳහන් ලකුණු පරිපාටියට අදාළව **2025.05.26** දිනැතිව සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කර ඇති විශේෂ ශ්‍රේණියේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී තනතුරට පත් කිරීම සඳහා වන විස්තරාත්මක ලකුණු පරිපාටිය ඇමුණුම 01 ලෙස දක්වා ඇත.

<u>සැලකිය යුතු ය :-</u>

සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවයට ලකුණු ලබාදීමක් සිදු කරනු නොලැබේ.

**04.** පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් දන්වා ඇති පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරේ විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු **03ට අදාළව ඉහත සියලුම සුදුසුකම් සපුරන සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ** පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් අතරින් ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ අනුපිළිවෙළින් පවතින පුරප්පාඩු ප්‍රමාණය මෙන් **හය (06) ගුණයක ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.** (යම් අයදුම්කරුවෙකු ඉදිරිපත් නොවන්නේ නම් ඒ පිළිබඳව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හා ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් මගින් මෙම කොමිෂන් සභා කාර්යාලයට ලිඛිතව දැනුම් දිය යුතු ය.)

**05.** <u>අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :-</u>

I. මේ සමග අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අයදුම්කාරියන් විසින් සකස් කරගනු ලබන අයදුම්පත් තම ආයතන ප්‍රධානීන් වෙත ඉදිරිපත් කළ යුතු ය. ආයතන ප්‍රධානීන් විසින් තමන්ට ලැබෙන අයදුම්පත්වල සඳහන් කරුණු අදාළ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුවල ඇතුළත් වාර්තා සමඟ සසඳා බලා නිරවද්‍යතාව පිළිබඳව සෑහීමකට පත්වීමෙන් අනතුරුව සහතික කළ යුතු ය.

II. අයදුම්පත් ඉදිරිපත් කරන නිලධාරීන් අතරින් ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ අනුපිළිවෙළ අනුව සුදුසුකම් සපුරන නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු මා වෙත යොමු කළ යුතු වේ. තවද අදාළ නිලධාරිනියන්ගේ පෞද්ගලික ලිපිගොනු යොමු කිරීමට ප්‍රථමයෙන් <u>එම පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කර</u>, කාර්යසාධන වාර්තා, චර්යා සටහන්, වැටුප් වර්ධක ගෙවීම්, කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රතිඵල හෝ වෙනත් ලිපිලේඛනවල අඩුපාඩු ඇත්නම් ඒවා සම්පූර්ණ කර යොමු කරන මෙන් වැඩිදුරටත් දන්වමි.

III. බඳවා ගැනීම් පරිපාටියට අනුකූලව ලකුණු ගණනය කිරීමේ දී අසම්පූර්ණව පෞද්ගලික ලිපිගොනු ඉදිරිපත් කිරීම ගැටළු සහගත වන අතර, එවැනි අවස්ථාවක දී <u>සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා කොමිෂන් සභාවේ ලේකම් සමඟ පත් කරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ</u>. එබැවින් අදාළ නිලධාරිනියන්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තු කරන ආයතන ප්‍රධානීන් විසින් අනිවාර්යයෙන්ම එම වගකීම දැරිය යුතු වේ. තම පෞද්ගලික ලිපිගොනුවේ ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා කටයුතු කිරීමට අදාළ නිලධාරිනියන්ද දැනුවත් කිරීම සුදුසු වේ.

IV. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ආයතන ප්‍රධානීන් විසින් පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කළ යුතු ය. පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් විසින් තමන්ට අයදුම්පත් ඉදිරිපත් වූ වහාම නිර්දේශ සහිතව ආවරණ ලිපියක් සමඟ මෙම කොමිෂන් සභා කාර්යාලය වෙත **2026.08.24** දිනට පෙර ඉදිරිපත් කළ යුතු ය. එම අයදුම්පතෙහි තොරතුරු පෞද්ගලික ලිපිගොනු සමඟ පරීක්ෂා කර බලා අයදුම්පත් ආකෘතියේ අදාළ කරුණු සහතික කරමින් මෙම කාර්යාලයට එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ හෝ වැරදි තොරතුරු සහිත අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඒ සම්බන්ධව පසුව ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බලනු නොලැබේ. තැපැලේ දී සිදුවන අස්ථානගතවීම් පිළිබඳව කොමිෂන් සභාව වගකියනු නොලැබේ.

06. උසස්වීම සඳහා තෝරාගනු ලබන අයදුම්කාරියන් රජයට අතිරේක වියදමක් නොවන පරිදි කෙටි දැනුම් දීමකින් උසස්වීම භාරගත යුතු වන අතර, උසස්වීම ලැබෙන කවර හෝ ස්ථානයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතු ය. එසේ ක්‍රියාත්මක විය නොහැකි උසස්වීම්ලාභියෙකු වේ නම් උසස්වීම අවලංගු කිරීමට සිදුවන බව දැනගත යුතු ය.

07. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය හා වේලාව අයදුම්කාරියන් වෙත ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් මගින් හෝ අයදුම්කාරියන් සේවය කරන ආයතනයට හෝ යථා කාලයේ දී දැනුම් දෙනු ලැබේ.

08. මෙහි සඳහන් නොවන යම් කරුණක් වේතොත්, ඒ සම්බන්ධව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

09. මෙම චක්‍රලේඛයේ හා අයදුම්පත්‍රයේ පිටපතක් සබරගමුව පළාත් සභාවේ නිල වෙබ් අඩවිය වන www.sg.gov.lkහි හා සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.sg.gov.lkහි පළ කර ඇත. මෙය ඉහත සුදුසුකම් සපුරා ඇති සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී තනතුරේ නිලධාරීන්ගේ දැනගැනීම සඳහා යොමු කරන්න.

එස්.පී.කේ. බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

එස්.පී.කේ. බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

පිටපත් :-

01. ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත. - ඔබගේ අංක CS06/01/20/06 හා 2025.07.07, 2025.10.04 දිනැති ලිපි අනුව කාරුණික දැනගැනීම සඳහා.
02. ආණ්ඩුකාර ලේකම්, සබරගමුව පළාත. - කාරුණික දැනගැනීම සඳහා

**<u>සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අතුරු වෛද්‍ය සේවයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී විශේෂ ශ්‍රේණියට (MT – 8) උසස් කිරීම සඳහා තෝරා ගැනීම.</u>**

1. මුලකුරු සමග නම :-.....................................................................................................
2. සම්පූර්ණ නම :-.........................................................................................................
.............................................................................................................................
3. තනතුර :-.................................................................................................................
4. දැනට සේවය කරන හෝ විශ්‍රාමික නම් අවසන් වරට සේවය කළ ආයතනය :-..............................
.............................................................................................................................
5. I. කාර්යාලීය ලිපිනය :-
.............................................................................................................................
II. පෞද්ගලික ලිපිනය :-
.............................................................................................................................
III. දුරකථන අංකය (පෞද්ගලික) :-.............................. WhatsApp අංකය :-..............................
E-mail :-....................................................................................................................
6. උපන් දිනය :-.............................................................................................................
7. ජාතික හැඳුනුම්පත් අංකය :-.......................................................................................
8. විවාහක / අවිවාහක බව :-...........................................................................................
9. I. මුල් පත්වීම ලැබූ තනතුර හා දිනය :-.......................................................................
පත්වීම ස්ථිර කර තිබේද :- ඔව් / නැත පත්වීම ස්ථිර කළ දිනය :-.............................................
II. II ශ්‍රේණියට උසස් කළ දිනය :-....................................................................................
III. I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් දිනය :-.............................................
IV. I ශ්‍රේණියට උසස් වූ දිනය (එම පත්වීම් ලිපියේ පිටපතක් අමුණන්න) :-.................................
V. I ශ්‍රේණියේ වසර 05ක සේවා කාලය සපුරන දිනය :-.............................................................
I ශ්‍රේණියට උසස් වූ දින සිට 2021.01.05 දිනට සේවා කාලය :- අවු:........ මාස:......... දින: ........
I ශ්‍රේණියට උසස් වූ දින සිට 2021.10.19 දිනට සේවා කාලය :- අවු:........ මාස:......... දින: ........
I ශ්‍රේණියට උසස් වූ දින සිට 2022.12.31 දිනට සේවා කාලය :- අවු:........ මාස:......... දින: ........
VI. එම ශ්‍රේණියේ සේවා කඩවීමක් සිදුවී ඇත්ද :- ඔව් / නැත
සේවය කඩවී ඇති කාලසීමාව :-.......................................................................................
නැවත සේවයේ පිහිටුවනු ලැබූ දිනය :-............................................................................
VII. අධි ශ්‍රේණියට උසස් වී ඇත්නම් උසස් වූ දිනය :-............................................................
අධි ශ්‍රේණියේ වසර 05ක සේවා කාලය සපුරන දිනය :-..........................................................
අධි ශ්‍රේණියට උසස් වූ දින සිට 2021.01.05 දිනට සේවා කාලය :- අවු:........ මාස:......... දින: .....
අධි ශ්‍රේණියට උසස් වූ දින සිට 2021.10.19 දිනට සේවා කාලය :- අවු:........ මාස:......... දින: .....
අධි ශ්‍රේණියට උසස් වූ දින සිට 2022.12.31 දිනට සේවා කාලය :- අවු:........ මාස:......... දින: .....
VIII. පරිපාලන ප.සෞ.සේ.නි. තනතුරට උසස් වී ඇත්නම් උසස් වූ දිනය :-......................................
පරිපාලන ප.සෞ.සේ.නි. තනතුරේ වසර 05ක සේවා කාලය සපුරන දිනය:-.....................................
පරිපාලන ප.සෞ.සේ.නි. තනතුරට උසස් වූ දින සිට,
2021.01.05 දිනට සේවා කාලය :- අවු:........ මාස:......... දින: .....
2021.10.19 දිනට සේවා කාලය :- අවු:........ මාස:......... දින: .....
2022.12.31 දිනට සේවා කාලය :- අවු:........ මාස:......... දින: .....
IX. විශ්‍රාම ගිය දිනය :-.....................................................................................................
X. විශ්‍රාම යාමට නියමිත දිනය :-........................................................................................

අකාර්යක්ෂමතාවය නිසා මා විශ්‍රාම ගැන්වීමට කටයුතු අරඹා නොමැති බවත්, මට විරුද්ධව පවත්වා හෝ පැවැත්වෙතැයි අදහස් කරන විනයානුකූල ක්‍රියාමාර්ගයක් නොමැති බවත් ප්‍රකාශ කරමි. ඉහතින් මා විසින් සපයන ලද තොරතුරු අසත්‍ය හෝ සාවද්‍ය බව හෙලිවුවහොත් එසේ සාවද්‍ය බව හෙලිවූයේ තෝරා ගැනීමට පෙර නම් මා නුසුදුස්සෙකු වන බවත් තෝරා ගැනීමෙන් පසුව හෙලිවුවහොත් මා වහාම සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

දිනය :-.....................................

..........................................
අයදුම්කරුගේ අත්සන

10. නියමිත පරිදි වැටුප් වර්ධක උපයාගෙන ඇති බව :-

| වර්ෂය | වැටුප් වර්ධක උපයාගෙන ඇත / නැත | වැටුප් වර්ධක උපයාගෙන නොමැති නම් ඊට හේතුව කෙටියෙන් |
|---|---|---|
| 2016 | | |
| 2017 | | |
| 2018 | | |
| 2019 | | |
| 2020 | | |
| 2021 | | |
| 2022 | | |

11. සුදුසුකම් සපුරාලන දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ ලබා ඇති කාර්යසාධන මට්ටම :-

| වර්ෂය | කාර්යසාධන මට්ටම | විශේෂ සටහන් |
|---|---|---|
| 2016 | | |
| 2017 | | |
| 2018 | | |
| 2019 | | |
| 2020 | | |
| 2021 | | |
| 2022 | | |

12. විශේෂ ශ්‍රේණියේ පත්වීම ලැබීමට සුදුසුකම් ලබා ඇති වර්ෂයට පෙර වසර 05 තුළ ලබා ඇති නිවාඩු විස්තර

| නිවාඩු වර්ගය | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|---|
| අනියම් | | | | | | | |
| විවේක | | | | | | | |
| අඩ වැටුප් | | | | | | | |
| වැටුප් රහිත | | | | | | | |

13. විශේෂ ශ්‍රේණියේ පත්වීම ලැබීමට සුදුසුකම් ලබා ඇති වර්ෂයට පෙර වසර 05 තුළ විනය දඩුවම් ලබා හෝ ඉදිරියට ක්‍රියාත්මක කිරීමට හෝ තිබේද යන්න

| වර්ෂය | විනයානුකූල දඩුවමක් ලබා තිබේද ( ඔව් / නැත ) | විනයානුකූල දඩුවමක් ලබා තිබේ නම් ඊට හේතුව කෙටියෙන් |
|---|---|---|
| 2016 | | |
| 2017 | | |
| 2018 | | |
| 2019 | | |
| 2020 | | |
| 2021 | | |
| 2022 | | |

ඉහත 1 සිට 13 දක්වා වූ සියලු තොරතුරු පෞද්ගලික ලිපිගොනුව හා නිවාඩු ලේඛනය අනුව නිවැරදි බවට සහතික කරමි.

පෞද්ගලික ලිපිගොනුව හා නිවාඩු ලේඛනය පරීක්ෂා කරන ලද නිලධාරියාගේ,

නම :-..............................................................................................................................

තනතුර :-..........................................................................................................................

දිනය :-............................................ අත්සන :-..................................................

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, සබරගමුව පළාත.

ඉහත සඳහන්..............................(ජා.හැ.අ.) දරන ................................................................... මිය / මෙය විසින් අයදුම්පතෙහි අංක 01 සිට 09 දක්වා සඳහන් කර ඇති කරුණු සහ පෞද්ගලික ලිපිගොනුව හා නිවාඩු ලේඛනය පරීක්ෂා කරන ලද නිලධාරියා විසින් 10 සිට 13 දක්වා සඳහන් කර ඇති කරුණු යන ඉහත සඳහන් සියලු කරුණු අදාළ නිලධාරිනියගේ පෞද්ගලික ලිපිගොනුවෙහි තිබෙන ලේඛන අනුව නිවැරදි බව සහතික කරමි.

නිලධාරිනිය විශේෂ ශ්‍රේණියට උසස් කිරීමට නියමිත යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීම සඳහා සියලු සුදුසුකම් සපුරා ඇත / නැත. නිර්දේශ කරමි / නොකරමි.

වෙනත් සටහන් :- ................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

........................................
ආයතන ප්‍රධානියාගේ අත්සන
(පෞද්ගලික ලිපිගොනුව නඩත්තු කරන ආයතනයේ ප්‍රධානියා)
කරුණාකර නිල මුද්‍රාව තබන්න

දිනය :-.......................................

ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය, සබරගමුව පළාත.

ඉහත සඳහන්..............................(ජා.හැ.අ.) දරන ................................................................... මිය / මෙය විසින් අයදුම්පතෙහි සියලු සුදුසුකම් සපුරා ඇති බවත්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී බඳවා ගැනීමේ පරිපාටියෙහි සඳහන් පරිදි ජ්‍යෙෂ්ඨතා ලේඛනය අනුව සුදුසුකම් සපුරන නිලධාරීන් අතරට ඇතුළත් බවත් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීම සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බවත් නිර්දේශ කරමි / නොකරමි.

වෙනත් සටහන් :- ................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

........................................
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
සබරගමුව පළාත
(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

දිනය :-.......................................

ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සබරගමුව පළාත.

ඉහත සඳහන්...............................(ජා.හැ.අ.) දරන ................................................................ මිය / මෙය විසින් අයදුම්පතෙහි සියලු සුදුසුකම් සපුරා ඇති බවත්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී බඳවා ගැනීමේ පරිපාටියෙහි සඳහන් පරිදි ජ්‍යෙෂ්ඨතා ලේඛනය අනුව සුදුසුකම් සපුරන නිලධාරීන් අතරට ඇතුළත් බවත් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීම සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බවත් නිර්දේශ කරමි / නොකරමි.

වෙනත් සටහන් :- ..........................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

..........................................

ලේකම්

ප්‍රධාන අමාත්‍යාංශය

සබරගමුව පළාත

(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

දිනය :-.......................................

**විශේෂ ශ්‍රේණියේ පවුල් සෞඛ්‍ය සේවා නිළධාරි තනතුරට පත් කිරිම සඳහා**
**විස්තරාත්මක ලකුණු පරිපාටිය**

| අනු අංකය | | ලකුණු | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | I ශ්‍රේණියේ සේවා කාලය<br>( I ශ්‍රේණියට උසස් වූ දින සිට ගණනය කරනු ලැබේ) | වසරක් සඳහා ලකුණු 02 බැගින් උපරිම වසර 05 | 10 |
| 02. | අධි ශ්‍රේණියේ සේවා කාලය<br>( අධි ශ්‍රේණියට උසස් වූ දින සිට ගණනය කරනු ලැබේ) | වසරක් සඳහා ලකුණු 02 බැගින් උපරිම වසර 10 | 20 |
| 03. | පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිළධාරි තනතුරේ සේවා කාලය (පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිළධාරි තනතුරට උසස් වූ දින සිට ගණනය කරනු ලැබේ) | වසරක් සඳහා ලකුණු 05 බැගින් වසර 06 | 30 |
| 04. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | | |
| | 04.1 පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිය<br><br>04.1.1 ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අනුමත රාජ්‍ය හෝ පෞද්ගලික විශ්ව විද්‍යාලයකින් පිරිනමන විෂයානුබද්ධ මහජන සෞඛ්‍ය උපාධියක් නම් ( පහත විෂයන් එම උපාධියට විෂයක් ලෙස හදාරා ඇත්නම් විෂයානුබද්ධ උපාධි ලෙස සැලකේ)<br>Reproductive health<br>Adolescent health<br>Health Promotion and Health Education<br>Records and Reports (Statics)<br>Team work (Human resource management)<br>Counseling<br>Local Governance<br>Public health management<br>Human resources management<br>Legislation<br>Disaster management<br>School Health Work | එක් උපාධියක් සඳහා ලකුණු 5 බැගින් (උපරිම උපාධි 02ක් සඳහා පමණි) | 10 |
| | 04.1.2 ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අනුමත රාජ්‍ය හෝ පෞද්ගලික විශ්ව විද්‍යාලයකින් පිරිනමන විෂයානුබද්ධ නොවන උපාධියක් නම් | එක් උපාධියක් සඳහා ලකුණු 03 බැගින් (උපරිම උපාධි 02ක් සඳහා පමණි) | |
| 05. | 05.1 රජයේ හෝ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයක ඩිප්ලෝමා<br>අදාල ඩිප්ලෝමාව<br>- මාස 03 වැඩි හෝ<br>- NVQ5 / NVQ6 මට්ටම හෝ<br>- ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ (Sri Lanka Qualifications Framework) හි අනුමත ඩිප්ලෝමාවක් විය යුතුය<br><br>05.1.1 විෂයානුබද්ධ ඩිප්ලෝමාවක් නම්,<br>( පහත විෂයන් හෝ එම දක්වා ඇති විෂයන්ට අදාල ඩිප්ලෝමාවක් හදාරා ඇත්නම් විෂයානුබද්ධ ඩිප්ලෝමාවක් ලෙස සැලකේ)<br>Reproductive health<br>Adolescent health<br>Health Promotion and Health Education<br>Records and Reports (Statics)<br>Team work (Human resource management) | එක් ඩිප්ලෝමාවක් සඳහා ලකුණු 02 බැගින් (උපරිම ඩිප්ලෝමා 3ක් සඳහා) | 06 |

| | | | |
|---|---|---|---|
| | Counseling<br>Local Governance<br>Public health management<br>Human resources management<br>Legislation<br>Disaster management<br>School Health Work<br><br>1. සෞඛ්‍ය අමාත්‍යාංශය / පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය / ජාතික සෞඛ්‍ය විද්‍යායතනය / රජයේ අධ්‍යයන ආයතනයකින් පවත්වන සේවස්ථ හෝ සේවස්ථ නොවන වැඩසටහනක් මගින් ලබාදෙන ඩිප්ලෝමාවක්<br><br>05.1.2 විෂයානුබද්ධ නොවන ඩිප්ලෝමාවක් නම්,<br>- මාස 03 වැඩි හෝ<br>- NVQ5 / NVQ6 මට්ටම හෝ<br>- ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ (Sri Lanka Qualifications Framework) හි අනුමත ඩිප්ලෝමාවක් විය යුතුය<br>*ඉංග්‍රීසි භාෂාව හෝ පරිගණක දැනුම සම්බන්ධ ඩිප්ලෝමාවන් සඳහා මෙම නිර්ණායක යටතේ ලකුණු ලබා නොදෙන අතර එය 07.1.1 හා 07.1.3 යටතේ සලකා බැලිය යුතුය. | එක් ඩිප්ලෝමාවක් සඳහා ලකුණු 1බැගින් උපරිම ඩිප්ලෝමා 3 ක් සඳහා | |
| 06. | 06.1 සහතික පත්‍ර පාඨමාලා - රජයේ හෝ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයකින් ලබා ගන්නා ලද සහතිකයක් විය යුතුය.<br><br>06.1.1 විෂයානුබද්ධ නම්<br>(පහත විෂයන් හෝ එම දක්වා ඇති විෂයන්ට අදාල සහතික පත්‍රයක් ලබා ඇත්නම් විෂයානුබද්ධ සහතිකයක් ලෙස සැලකේ)<br><br>Adolescent health<br>Health Promotion and Health Education<br>Records and Reports (Statics)<br>Team work (Human resource management)<br>Counseling<br>Local Governance<br>Public health management<br>Human resources management<br>Legislation<br>Disaster management<br>School Health Work<br><br>1.තම ආයතනය මගින් යොමු කර හෝ තමා විසින් පෞද්ගලිකව අයදුම් කර සෞඛ්‍ය අමාත්‍යාංශය /පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය / ජාතික සෞඛ්‍ය විද්‍යායතනය / රජයේ අධ්‍යයන ආයතනයකින් පවත්වන සේවාස්ථ හෝ සේවාස්ථ නොවන වැඩසටහනක් මගින් ලබාදෙන සහතිකයක්<br>*ඉංග්‍රීසි භාෂාව සම්බන්ධ සහතික පත්‍ර පාඨමාලා හෝ පරිඝනක දැනුම සම්බන්ධයෙන් වන Electronic Reproductive Health Information System සහතික පත්‍ර පාඨමාලාව සඳහා මෙම නිර්ණායක යටතේ ලකුණු ලබා නොදෙන අතර එය 07.1.2 හා 07.1.4 යටතේ සලකා බැලිය යුතුය. | එක් සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා ලකුණු 1බැගින්<br><br>උපරිම සහතික පත්‍ර පාඨමාලා 3 ක් සඳහා | 03 |
| 07. | 07.1 ඉංග්‍රීසි භාෂාව හා පරිගණක දැනුම<br><br>07.1.1 ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාවක් හදාරා තිබීම.<br><br>එකී ඩිප්ලෝමාව<br>- මාස 03 වැඩි හෝ | | |

| | | | |
|---|---|---|---|
| | - NVQ5/NVQ6 හෝ<br>- Sri Lanka Qualifications Framework හි අනුමත ඩිප්ලෝමාවක් විය යුතුය.<br>07.1.2 ඉංග්‍රිසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සඳහා රජයේ හෝ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයකින් ලබා ගන්නා ලද ඉංග්‍රිසි භාෂාව පිළිබඳ සහතික පත්‍රයක් විය යුතුය.<br>07.1.3 පරිඝණක දැනුම පිළිබඳ ඩිප්ලෝමාවක් හදාරා තිබීම.<br>එකී ඩිප්ලෝමාව<br>- මාස 03 වැඩි හෝ<br>- NVQ5/NVQ6 හෝ<br>- Sri Lanka Qualifications Framework හි අනුමත ඩිප්ලෝමාවක් විය යුතුය.<br>07.1.4 පරිඝණක දැනුම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව Electronic Reproductive Health Information System පාඨමාලාව පමණක් විය යුතුය. | ලකුණු 02<br>ලකුණු 01<br>ලකුණු 02<br>ලකුණු 01 | 06 |
| 08. | 08.1 දින 3කට වඩා වැඩි පුහුණුවීම්<br>08.1.1 විෂයානුබද්ධ නම් පමණක්<br>සෞඛ්‍ය අමාත්‍යාංශය / පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය / ජාතික සෞඛ්‍ය විද්‍යායතනය / විශේෂිත ව්‍යාපාර / පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය / දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වැනි ආයතනයකින් හෝ උක්ත ආයතන සමග සම්බන්ධිකරණයෙන් වෙනත් ආයතනයක් මගින් දින 03 කට වඩා පවත්වන පුහුණු / සේවාස්ථ වැඩසටහනක් සඳහා නිකුත් කරන සහතික පත්‍රයක් හෝ සහභාගිත්වය තහවුරු කරන ලිපියක් හෝ සහභාගීත්වය තහවුරු කරන ලිපියක් | ලකුණු 1 බැගින් උපරිම පුහුණු 05ක් සඳහා | 05 |
| 09. | 9.1 විෂයානුබද්ධ දැනුම පරීක්ෂා කිරීම (සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී පරීක්ෂණ මණ්ඩලය මගින් අසනු ලබන විෂයානුබද්ධ වාචික ප්‍රශ්න 5 කින් සැදුම්ලත් වේ.) | එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ප්‍රශ්න 05 කට | 05 |
| | 9.2 සේවා ඇගයීම් (ජාතික මට්ටමේ හෝ පළාත් මට්ටමේ නම් පමණක්) | ජාතික මට්ටම ලකුණු 2<br>පළාත් මට්ටම ලකුණු 1 | 03 |
| | 9.3 සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති<br>ව්‍යාපෘති ලෙස සලකා බලනු ලබන්නේ<br>1. මව් හවුල් හා වෙනත්සෞඛ්‍ය ප්‍රවර්ධන<br>2. මව්කිරි කළමනාකරණ වැඩසටහන<br>3. පෝෂණ වැඩසටහන<br>4. සෞඛ්‍ය ප්‍රවර්ධනය/සෞඛ්‍ය අධ්‍යාපනය/උපදේශනය<br>5. බෝ නොවන රෝග<br>6. බෝවන රෝග / වසංගතවේදය<br>7. ආපදා කළමනාකරණය<br>8. ජීවන චක්‍රය ආශ්‍රිතව ඇතිවන ගැටළු විසඳීම සඳහා ක්‍රියාත්මක කරන ලද විශේෂිත වැඩසටහන්<br>සෞඛ්‍ය අමාත්‍යාංශය / පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය / ජාතික සෞඛ්‍ය විද්‍යාය විශේෂිත ව්‍යාපාර / පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය / දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වැනි ආයතනයකින උක්ත ආයතන සමග සම්බන්ධිකරණයෙන් වෙනත් ආයතනයක් මගින් පවත්වන පුහුණු / සේවාස්ථ වැඩසටහනක් සඳහා සකස් කරනු ලබන ව්‍යාපෘතියක් ( අදාල ව්‍යාපෘතිය නිළධාරියා විසින් සිදුකල බවට තහවුරු කර තිබිය යුතුය) | ව්‍යාපෘතියක් සඳහා ලකුණු 1 බැගින් උපරිම ව්‍යාපෘති 02 ක් සඳහා | 02 |